**ශීර්ෂය 145 - නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------

මෙම වාර්තාවේ 1 ඡේදය හා 2 ඡේදයේ අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1. 1 විගණන විෂය පථය

----------------------

නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ඔක්තෝබර් 06 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

-------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

--------

### 2.1 විසර්ජන ගිණුම

--------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 403.45 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 398.41 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම රු.මිලියන 5.04 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.25 ක ප්‍රමාණයක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 174.11 | 172..30 | 1.81 | 1.04 |
| මූලධන | 229.34 | 226.11 | 3.23 | 1.41 |
| **එකතුව** | **403.45** | **398.41** | **5.04** | **1.25** |

## 2.2 අත්තිකාරම් ගිණුම

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 14501 | 4.0 | 3.12 | 2.0 | 2.3 | 12.5 | 7.8 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 0.195 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂය 145 - නැවත පදිංචිකිරීමේ අමාත්‍යාංශය**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ආ) | රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාර 26 වැනි පරිශිෂ්ඨය | පවත්වා නොතිබුණි. |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (ඈ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඉ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 14501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.338,755 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 4 ක පමණ කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

**3.3 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණි. කෙසේවුවද,අභ්‍යන්තර විගණකවරයකු පත්කර නොතිබුණි. අමාත්‍යාංශය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු.403,458,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර, කාර්ය මණ්ඩලය 101 ක් වී තිබුණි. අමාත්‍යාංශය සතු වත්කම්වල වටිනාකම රු.187,350,460 ක් විය. එසේම උතුරු නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක 08 ක අවතැන්වූ ජනතාව නැවත පදිංචි කරවීමේ සුභ සාධන කටයුතුවලට රු.262,000,000 ක්ද, වැළිඔය නිවාස 357 ක් ඉදිකිරීමට රු.58,000,000 ක්ද, ප්‍රතිපාදන සළස්වා තිබුණු අතර එම කටයුතු පිළිබඳව අභ්‍යන්තර විගණනයන් සිදුකිරීම සමාලෝචිත වර්ෂයේ විගණන සැළැස්මට ඇතුළත් කර තිබුණු නමුත් ඒ සම්බන්ධව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3.5 කාර්යසාධනය**

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) වැලිඔය නිවාස ඉදිකිරීම දෙවන අදියර**

ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් අවතැන්වූ ජනතාව සඳහා වැලිඔය ඒකාබද්ධ නිවාස සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ නිවාස 357ක් ඉදිකිරීමේ කටයුතු සැලැසුම් කළ පරිදි 2013 වර්ෂයේදී අවසන් කිරීමට නොහැකි වී තිබුණි. 2014 මැයි මාසයේදී පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරිම් මගින් රු.40,000,000 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට නිවාස ඉදිකිරීම වෙනුවෙන් රු.38,157,804 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂයේදී රු.40,000,000 ක පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරිම් මගින් ලබාගත් ප්‍රතිපාදනවලින් නිවාස ඉදිකිරීම් කටයුතු සිදුකිරීමේදී මුලතිව් දිස්ත්‍රික් ලේකම් විසින් රු.17,904,594 ක් හා අමාත්‍යාංශය විසින් රු.19,657,803 ක් වශයෙන් රු.37,562,397 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම නිවාස ඉදිකිරීම් අවසන් කර නොතිබුණු අතර එම දිනය වනවිට සම්පුර්ණයෙන්ම ඉදිකිරීම අවසන් කර තිබුණු නිවාස සංඛ්‍යාව පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2012 වර්ෂයේ ඉදිකර තිබුණු නිවාස 500 කින් 2014 වර්ෂය වන විටත් පදිංචිය තහවුරු නොකළ නිවාස 26 ක් පැවති අතර විගණනයෙන් එම තත්ත්වය පෙන්වා දුන් පසුව එම නිවාස පිළිබඳ තත්ත්වය අමාත්‍යාංශය විසින් පසුවිපරම් කිරීමේදී තවත් නිවාස 23 ක් සම්පූර්ණ වී නොමැති බව වාර්තා කර තිබුණි. එසේම ඉහත නිවාස 26 න් නිවාස 16 ක් අත්හැර ඇති බව පසුවිපරම් වාර්තාව මගින් නිරීක්ෂණය විය. එම නිවාස සම්බන්ධව අමාත්‍යාංශය විසින් ඉදිරි කටයුතු පිළිබඳව ගන්නා ලද ක්‍රියාමාර්ගයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එසේම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මෙම නිවාස ඉදිකිරීම සඳහා අමාත්‍යාංශය වෙත දායකත්වය ලබාදී තිබුණු අතර, එහිදී එක් එක් ප්‍රතිලාභියා වෙත ලබාදී ඇති භාණ්ඩ ලැයිස්තුව හා නිවාස වෙනුවෙන් වැය කර තිබුණු සමස්ථ වියදම පිළිබඳ විස්තර අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙතින් ලබාගෙන නොතිබුණි.

**(ආ) පානීය ජලය සහ සනීපාරක්ෂක සේවා සැපයීම**

**----------------------------------------------------**

උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක 08 ක අවතැන්වූ ජනතාව සඳහා පානීය ජලය සහ සනීපාරක්ෂක සේවාවන් සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.143,963,092 ක ප්‍රතිපාදන සළසා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක 8 ක පානීය ජලය සහ සනීපාරක්ෂක සේවාවන් සැපයීම සඳහා රු.143,963,092 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම දිස්ත්‍රික්ක 08 සඳහා අමාත්‍යාංශය විසින් රු.149,998,542 ක් ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු වටිනාකමට වඩා රු.6,035,450 ක් වැඩියෙන් ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. එසේ වැඩියෙන් මුදල් නිදහස් කිරීම සම්බන්ධයෙන් වූ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) එසේම සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ ගිණුම් අනුව උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක 03 ක සිදුකරන ලද කාර්යයන් සඳහා රු.85,705,093 ක් වැය කර තිබුණත්, ඒ සම්බන්ධ වියදම් පිළිබඳ විස්තර වාර්තා අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් ලබාගෙන නොතිබුණි.

(iii) ඉහත සඳහන් කාර්යයන් ඉටු කිරිම සඳහා අමාත්‍යාංශය විසින් නිදහස් කර තිබුණු මුදල්වලින් එකතුව රු.1,366,866 ක මුදල් ශේෂය ආදාළ පාර්ශවයන්ගෙන් ආපසු අයකර ගැනීමට අමාත්‍යාංශය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(iv) මෙම ව්‍යාපෘතින්වල වැඩ අවසන් කිරීම සහ ප්‍රතිලාභීන්ට භාරදීම යන කටයුතු

සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසයට පෙර සිදුකළ යුතු වුවද, එම කාලය තුළ කිසිදු ව්‍යාපෘතියක වැඩ අවසන් කර ප්‍රතිලාභින්ට භාරදී නොතිබුණි.

**4.1 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 09 | 02 |
| (ii) තෘතියික මට්ටම | 06 | 02 | 04 |
| (iii) ද්විතියික මට්ටම | 85 | 61 | 24 |
| (iv) ප්‍රාථමික මට්ටම | 27 | 26 | 01 |
| **එකතුව** | **129** | **98** | **31** |

**(ආ) වෙනත් පාර්ශවයන් ලබාගත් මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් වෙනත් රාජ්‍ය ආයතන වලින් ලබාගෙන තිබුණ මානව සම්පත් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| ද්විතියික මට්ටම | 01 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 2005.04.03 දින සිට අඛණ්ඩව |
| තෘතියික මට්ටම | 01 | ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව | 2014.05.02 දින සිට අඛණ්ඩව |